# කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වාර්තා කරන්නේ කෙසේද

2019 වික්ටෝරියානු සංස්කරණය

## පටුන


2. අසාධාරණයට ලක්වීම ප්‍රචණ්ඩත්වයට බලපාන අයුරු අවබෝධ කර ගැනීම 4

**3. කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ පියවර 10ක් 5**

3. ග ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී කාන්තාවන් විසින් අත්විඳින ලද ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම 9

4. නරක වාර්තාකරණයේ සිට වඩාත් හොඳ වාර්තාකරණය දක්වා ඕස්ට්‍රේලියාවෙන් හා ලෝකයෙන් උදාහරණ 10

4ග සුලබ දුර්මත 12

3. ග ග තොරතුරු හා දත්ත 13

සංඛ්‍යා ලේඛන 13

දත්තවල ගැටලු 14

5. කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ බලපෑම් 15

6. නිර්වචන 15

යෙදුම් 15

7. මාධ්‍ය හා පසුබිම් සම්බන්ධතා 16

8. මූලාශ්‍ර හා වැඩිදුර කියවීම් 17

## 1. මෙම මාර්ගෝපදේශන වැදගත් වන්නේ ඇයි

කාන්තාවන්ට හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඕස්ට්‍රේලියාවේ බරපතල ගැටලුවක් ව පවතියි. සාමාන්‍යයෙන් සතියකට එක් කාන්තාවක්, ඇයගේ වත්මන් හෝ කලින් සහකරුවා විසින් මරා දමනු ලැබේ. (AIC, 2017).

අධ්‍යයනවලින් පෙන්වා දී ඇති අන්දමට, මාධ්‍ය, සමාජ වෙනස සම්බන්ධයෙන් වන බලවත් පාලක සාධකයක් වේ. එමගින් කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කෙරෙන සංස්කෘතිය, චර්යාවන් හා ආකල්ප කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට හැකිය. එසේ ම වරක් වසරේ ඕස්ට්‍රේලියානුවා වූ රෝසි බැටි Rosie Batty මාධ්‍යට සඳහන් කළ ආකාරයට, මාධ්‍ය "ප්‍රචණ්ඩත්වය ආරම්භවීමටත් පෙර එය අවසන් කිරීම සඳහා වූ සුවිශේෂී ස්ථානයක සිටියි." එයට හේතු කිහිපයකි:

- කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන ශක්තිමත් මාධ්‍ය වාර්තාකරණය, පාඨකයන්ට, අසන්නන්ට හා නරඹන්නන්ට එය කෙතරම් පුළුල්ව පැතිර ඇත්ද, එමගින් බලපෑමට ලක්වී ඇත්තේ කවුද, එය සිදුවන්නේ ඇයි හා එය වලක්වා ගන්නේ කෙසේද යන්න ගැන අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වේ.
- කාන්තාවන්ට හා දරුවන්ට ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන සිය අත්දැකීම් අවබෝධ කර ගැනීමට හා තමා ඒ ගැන කතා කළ යුතුද යන්න ගැන මෙන් ම ක්‍රියාත්මක වීමට හෝ උදව් ලබා ගැනීම සඳහා වන තීරණවලට බලපෑම් සිදු වන ආකාරය වෙනස් කිරීමට මාධ්‍යය හැකිය.
- ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට කරන තමාගේ තෝරා ගැනීම් හා සිය චර්යාවන් වෙනස් කර ගැනීමට උදව් ලබා ගැනීමට අවශ්‍යද යන්න සම්බන්ධයෙන් අපරාධකරුවන් අවබෝධ කරගන්නා ආකාරයට බලපෑම් කිරීමට මාධ්‍යයට හැකිය.
- කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සිය විමර්ශනයන් තුළින් පොදු ප්‍රතිපත්ති හා නීතිවලට බලපෑම් කිරීමට මාධ්‍යයට හැකි වේ. (උදාහරණ වශයෙන් දැඩි අවදානයට ලක් වූ දූෂණ නඩුවක් සම්බන්ධයෙන් වූ Four Corners විමර්ශනයෙන් පසු නිව් සවුත් වේල්ස් රජය විසින් අනුමැතිය පිළිබඳ ප්‍රාන්තීය නීති ගැන Law Reform Commission වෙතින් විමසීමක් සිදු කර ඇත.)
- සමාජය තුළ ප්‍රචණ්ඩත්වය කතාබහට ලක්වන්නේ කෙසේද යන්න වෙනස් කිරීමට - විශේෂයෙන් ම බහු විධ වූ අසාධාරණයන් හා පීඩාවන්වලට ලක්වන කාන්තාවන් විසින් අත්විඳින ප්‍රචණ්ඩත්වය ගැන වන කතිකාවන් වෙනස් කිරීමට හා ප්‍රචණ්ඩත්වය කිසිවිටෙකත් පිළිගැනීමට නොහැකි බවටත් එය සමාව ලැබීමට කාරණයක් නොවන බවටත් වන විශ්වාසය උත්කර්ෂයට නැංවීමට

> *"ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුවට වේදිකාවක් නිර්මාණය කිරීමට, කුටුම්භ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වඩාත් විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමට හා සැබෑ වෙනසක් අත්පත් කර ගැනීමට සුවිශේෂී තැනක මාධ්‍ය සිටියි."*
>
> **- Rosie Batty,**
> කුටුම්භ ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරිනියක් කලින් වසරේ ඕස්ට්‍රේලියානුවා

**වික්ටෝරියාව තුළ කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වය මාධ්‍ය මගින් ආවරණය කිරීම සැලකිය යුතු ලෙස දියුණු වී තිබේ.** මාධ්‍ය ආයතන විසින් ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන හේතු ගැන වැඩි වැඩියෙන් සොයා බලමින්, අනවධානය නිසා වින්දිතයන්ට චෝදනා කෙරෙන භාෂාත්මක යෙදුම් භාවිතයෙන් වැලකීම, අපරාධකරුවන් ගනු ලැබූ තීරණ ගැන සමාව දීම හෝ මත්පැන් හා මානසික රෝග ආදිය ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට හේතු වශයෙන් සාවද්‍ය ලෙස යෝජනා කිරීම ආදියෙන් වැළකෙමින් සිටියි.

එහෙත් අපට තව බොහෝ දුර යාමට තිබේ. මෑතක දී සිදු කළ වාර්තාවකින් අනාවරණය වූ අන්දමට ඕස්ට්‍රේලියාවේ සිදුවීම් පාදක මාධ්‍ය වාර්තාවලින් සියයට 15ක්, වින්දිතයා බීමතින් සිටි බව, අපරාධකරුවා සමග උකුළු මුකුළු කළ බවට හෝ ඔහු සමග නිවසට ගිය බව නැත්නම් රෑ බෝ වීමෙන් පසු පිටත සිටි බවට වින්දිතයාට චෝදනා එල්ල කරන අංගවලින් යුතු බව සොයාගෙන තිබේ. ඒ හා සමාන ප්‍රමාණයක් අපරාධකරුවාට නිදහසට කරුණු සපයන එනම්, උදාහරණ වශයෙන් ඔහු බීමතින් සිටි බව, මත්ද්‍රව්‍ය භාවිත කොට සිටි බව, ඊර්ෂ්‍යාව, "ක්ෂණික කෝපය" හෝ "පාලනය ගිලිහී ගිය" බව දක්වන ඒවා විය.(ANROWS, 2016) බහු විධ වූ අසාධාරණයන්ට හා පීඩාවන්ට ලක්වන කාන්තාවන් සම්බන්ධයෙන් සළකා බැලීමේ දී මෙම සොයා ගැනීම් විශේෂයෙන් ම අදාළ වේ.

මෙම සොයාගැනීම් හා අදාළ වෙනත් සොයා ගැනීම්වලට ප්‍රතිචාර සේ මාධ්‍ය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධානවල නියෝජිතයන්ගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, Our Watch විසින් මෙම මාර්ගෝපදේශන සකස් කර තිබේ.

**සිය වාර්තාකරණයන් සියලු කාන්තාවන්ට හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට වන විසඳුමෙහි අංගයක් බවත් එමගින් නොනැසී සිටින්නන්ට හානි සිදු වීම හෝ ප්‍රචණ්ඩත්වයට මග පාදන්නා වූ ආකල්ප සහ චර්යාවන් වර්ධනයට උපකාරී නොවන බවටත් තහවුරු කර ගැනීමට මාධ්‍යවලට භාවිත කළ හැකි උපක්‍රම හා තොරතුරු මෙම මාර්ගෝපදේශන මගින් ලබා දෙයි.**

## 2. අසාධාරණයට ලක්වීම ප්‍රචණ්ඩත්වයට බලපාන අයුරු අවබෝධ කර ගැනීම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය එක් සංස්කෘතියකට හෝ ප්‍රජාවකට පමණක් සීමා නොවේ. කෙසේ වෙතත් අසාධාරණ ලෙස සැලකීමට මග පාදන්නා වූ **බලය අසමතුලිත ලෙස බෙදී යාම නිසා සමහර කාන්තාවන් විසමානුපාතික ලෙස ප්‍රචණ්ඩත්වයේ බලපෑමට ලක්වීම**, නැවත නැවතත් ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් බවට පත් වීම, ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ දී හා සුවිශේෂී උපකාර සේවා ලබා ගැනීමේ දී පද්ධතිමය බාධක ඇතුළුව අතිරේක බාධකවලට මුහුණපෑම දැකිය හැකිය.

විසමානුපාතික ලෙස ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන් පහත දැක්වෙන කණ්ඩායම් ඇතුළත් වුවත් ප්‍රචණ්ඩත්වය එම කණ්ඩායම්වලට පමණක් සීමා නොවේ.

- ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී
- සංක්‍රමණික හා සරණාගත
- දුබලතා සහිත
- LGBTIQ+, සහ
- වියපත් කාන්තාවන්

> **භාෂාව ගැන සටහනක්**
>
> මෙම වාර්තාවේ අරමුණ සඳහා, කුටුම්භ හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ලිංගික අඩම්තේට්ටම් හා හිංසන, නාඳුනන්නන් විසින් සිදු කරන ශාරීරික හිංසන ආදී කාන්තාවන් විසින් අත්විඳින සියලු ප්‍රචණ්ඩත්වයන් දැක්වීමට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යන යෙදුම යොදාගෙන තිබේ. නිර්වචන සඳහා 15 පිටුව බලන්න

කාන්තාවන් විසින් මුහුණ පෑමට යෙදෙන විවිධාකාර වූ පීඩාවන් හෝ අසාධාරණයන් ගැන මෙන් ම මෙමගින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් වඩාත් තීව්‍ර කරන්නේ කෙසේද යන්න සිතා බැලීම වැදගත් වේ. උදාහරණ ලෙස දුබලතාවක් සහිත ඇබොරිජිනල් කාන්තාවක් ඇගේ ජාතිකත්වය හා නොහැකියාව නිසා අසාධාරණයට ලක්වන අතර ම ඇයට ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා ඇතිවන අසමානතාවලට ද මුහුණපෑමට සිදුවිය හැකිය. සමහර කාන්තාවන්ට උපකාර ලබා ගැනීමට හෝ උපකාර සේවාවලට යොමුවීම දුෂ්කර වීම ද මෙමගින් පැහැදිලි වේ. ආයතනික ලෙස හෝ රාජ්‍ය අනුදැනීම සහිතව හිරිහැරවලට ලක් වූ හෝ ලක් වෙමින් සිටින කණ්ඩායම්වලට මෙය විශේෂයෙන් අදාළ වේ.

සමහර කාන්තාවන් අනනුපාතික ලෙස ප්‍රචණ්ඩත්වයට ලක් වීමට හේතු මෙසේ දැක්විය හැකිය.

- **බහුවිධ වූ අසාධාරණයන්ට හෝ පීඩාවන්ට ලක්වන කාන්තාවන් අත්දකින ප්‍රචණ්ඩත්වය නොසළකා හැරීමට ලක් වීමට ඉඩ තිබේ.** උදාහරණ ලෙස එය 'ඔවුන්ගේ සංස්කෘතියේ අංගයක්' සේ සළකා කටයුතු කිරීම, ආගමික පාඨ මගින් සාධාරණීකරණය කර තිබීම හෝ 'රැකවරණ සපයන්නකු වශයෙන් ආතතියට ලක් වී සිටින' විඩීමත්/අවිධිමත් රැකවරණ සපයන්නකු විසින් නිදහසට කරුණක් සේ සැළකීම දැක්විය හැකිය.
- **බහුවිධ අසාධාරණයන්ට හා පීඩාවන්ට ලක්වන කාන්තාවන් බොහෝ විට ඒකාකෘතික ලෙස දක්වා ඇත.** උදාහරණ වශයෙන් ඔවුන් 'සෝෂකාරී, කළහකාරී, මත්ද්‍රව්‍ය භාවිත කරන්නියන්' ලෙස වයස හෝ දුබලතා නිසා අලිංගික ලෙස ලේබල් කිරීම හෝ ඔවුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය කිරීම හා එය වරප්‍රසාද නොමැති වීමට සම්බන්ධ කිරීම.
- **කළහකාරීබව අවධාරණය කරන්නා වූ පුරුෂ සමපාදස්ථ සම්බන්ධතා, සමහර කාන්තාවන් කෙරෙහි වැඩිපුර බලපෑම් සිදු කළ හැකිය.** උදාහරණ ලෙස සංක්‍රමණික පසුබිම්වලින් පැමිණෙන කාන්තාවන් ශෘංගාරිකට ලෙස දැක්වීම, ලිංගික සංචාරක කර්මාන්තය, 'ජාතිවාදී අසභ්‍ය නිර්මාණ' හා රාග ආශා ඉපදවීම සඳහා ඉලක්ක කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම.
- **නිදහස සීමා කිරීමට මග පාදන, පුරුෂයින් තීරණ ගැනීම සම්බන්ධයෙන් දක්වන පාලනය නිසා සමහර කාන්තාවන් වැඩි වශයෙන් බලපෑමට ලක්විය හැකිය.** උදාහරණ ලෙස අධ්‍යාපනය හා රැකියාවක් කිරීමට එක හා සමාන අවස්ථාවක් නොමැති වීම හා 'හුදෙක් සංස්කෘතියේ අංගයක්' ලෙස තීරණ ගැනීමෙහි ලා පුරුෂයාට ඇති පාලනය සාධාරණීකරණය කිරීම

ව්‍යුහාත්මක වශයෙන් අසාධාරණයට ලක් කිරීම හා පීඩාවට ලක්කිරීම මගින් කාන්තාවන් අත්විඳින ප්‍රචණ්ඩත්වය තීව්‍ර කළ හැකි බව මාධ්‍ය විසින් අවබෝධ කර ගැනීම වැදගත් වන නමුත්, ඔවුන්ගේ සංස්කෘතියට, ලිංගිකත්වයට, වෘත්තීය තෝරා ගැනීම්වලට, දුබලතාවලට හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වන්නා වූ වෙනත් සාධක සම්බන්ධයෙන් චෝදනා එල්ල කිරීම සාධාරණ බව මෙයින් අදහස් නොවේ.

## 3. කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ පියවර 10ක්

ඔබේ වාර්තාකරණය කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ගැටලුවට වන **විසඳුමෙහි අංගයක්** බවත් එමගින් වින්දිතයන්ට/ප්‍රචර්තකයන්ට අලුත් හෝ අතිරේක හානි සිදු නොවන බව හා ප්‍රචණ්ඩත්වයට උපකාරී වන්නා වූ ආකල්ප හා චර්යාවන් ප්‍රතිස්ථාපනය නොකරන බවත් තහවුරු කර ගැනීම උදෙසා වන පියවර 10ක් මෙසේ වේ :

### 1. නම් කරන්න

**කළ යුතු:** චෝදනා එල්ල කර ඇත්නම්/එසේ කර ඇති විට නීත්‍යානුකූලව සඳහන් කළ හැකි අවස්ථාවල දී 'කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, 'කුටුම්භ ප්‍රචණ්ඩත්වය', 'අඩන්තේට්ටම් සිදු කිරීම', 'ලිංගික අඩන්තේට්ටම් සිදු කිරීම', 'වියපත් අය අපචාරයට ලක් කිරීම', 'ළමා අපචාර', 'ළමා සූරාකෑම් භාණ්ඩ','දූෂණය' හෝ 'ඝාතනය' යන යෙදුම් භාවිත කරන්න. කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හුදෙක් අනාවැකි පළ කළ නොහැකි 'අහඹු ප්‍රචණ්ඩත්ව සිදුවීම්' නොව ඒවා පුළුල් ලෙස ව්‍යාප්තවී ඇති බව ප්‍රේක්ෂකයන්ට අවබෝධ කරවීමට එය උපකාරී වේ. පිටු 17 *නිර්වචන බලන්න.*

**නොකළ යුතු:** ප්‍රචණ්ඩත්වය අවමකරන/අවතක්සේරු කරන යෙදුම් භාවිත නොකරන්න. (උදා 'ගෘහස්ත ආරවුල්', 'අස්ථාවර සම්බන්ධතා', 'ළමයින් යොදා ගැනෙන අසභ්‍ය නිර්මාණ')

> *"ප්‍රචණ්ඩත්වයේ හා තියුණු සංවේගයේ නොනැසී සිටින්නන් සේ අපේ අම්මාගේ සිදු වීම වාර්තා වූ ආකාරය අපට ගැඹුරින් බලපෑවා. හැදී වැඩෙන කොට මම හිතුවෙ කුටුම්භ ප්‍රචණ්ඩත්වය ජීවිතේ කොටසක් කියලා, ඒත් මම දැන් දන්නවා ඒක එහෙම වෙන්න ඕනේ නෑ"*
>
> **- Arman Abrahimzadeh,**
> Our Watch සන්නාමකරු

### 2. අංක එක ආරක්ෂාවයි

**කළ යුතු:** ගැටලුවක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී නොනැසී සිටින්නාගේ ආරක්ෂාවෙ හි විශ්වසනීයත්වය පළුදු නොවන ලෙස එය සිදුවන බව තහවුරු කර ගන්න. නොනැසී සිටින්නන්/සිදු වූයේ කුමක්ද (උදාහරණ වශයෙන් දරුවන් ගණන, නිවසේ හෝ සුරතල් සතුන් ගැන තොරතුරු, බලය යොදා ඇති අයුරු හෝ ආයුධ පිළිබඳ තොරතුරු, ඇති වූ තුවාල ගැන තොරතුරු) පිළිබඳවන විශේෂිත තොරතුරු මගින් ඔවුන් හඳුනා ගැනීමේ අවදානමක් ඇති විය හැකි බව සළකා බලන්න.

**කළ යුතු:** යම් කිසි පුද්ගලයකු හඳුනාගැනීමේ අනන්‍යතා ඉවත් කර ඇතත්, සමහර ප්‍රජාවන් හි දී උදාහරණ වශයෙන් ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී හෝ ග්‍රාමීය හා දුරස්ථ ප්‍රදේශවල ප්‍රජාවන් හි දී ඔවුන් හඳුනාගැනීම පහසු විය හැකිය.

### 3. සාක්ෂි පාදක භාෂාවක් භාවිත කරන්න

**කළ යුතු:** පහත දැක්වෙන කරුණු ඇතුළත් ව, ගෝලීය වශයෙන් **කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය බොහෝ විට ස්ත්‍රීපුරුෂ සමාජභාවයෙහි ඇති අසමානතා නිසා පාලනය කෙරෙන බව** ප්‍රේක්ෂකයාට අවබෝධ කෙරෙන ආකාරයේ **සාක්ෂි** වඩාත් පැහැදිලිවන ආකාරයේ භාෂාවක් හා යෙදීම් භාවිත කිරීම.

- කාන්තාවන්ට එරෙහිව පුරුෂයන් විසින් දක්වන ප්‍රචණ්ඩත්වය නොසළකා හැරීම
- තීරණ ගැනීමේ ක්‍රියාවලිය පුරුෂයා විසින් පාලනය කිරීම හා කාන්තාවගේ නිදහසට සීමා පැනවීම
- පුරුෂභාවය හා ස්ත්‍රීභාවය පිළිබඳව ගොඩනැගී ඇති ඒකාකෘතික සැකසුම්
- කාන්තාවන් කෙරෙහි ගෞරවයක් නොදැක්වීම හා ආක්‍රමණශීලීබව අවධාරණය කරන්නා වූ පුරුෂ සමපදස්ථ සම්බන්ධතා

**නොකළ යුතු:** ප්‍රචණ්ඩත්වය මත්පැන් හා මත්ද්‍රව්‍යවලින් පාලනය කෙරෙන, 'කුළු ගැන්වෙන' බව හෝ මානසික සෞඛ්‍යයට, ආතතියට, මූල්‍ය කටයුතුවලට, සංස්කෘතියට, දුබලතාවක් ඇති අයෙකුට රැකවරණ සැපයීමේ දී ඇතිවන 'බරක් වූ වගකීමට' සම්බන්ධ බවට නැත්නම් අපරාධකරුවාගේ 'ක්ෂණික කෝපය' නිසා සිදුවූ බවට විස්තර කිරීම. මෙය සාක්ෂි සමඟ සමපාත නොවේ. මෙම ගැටලු, ප්‍රචණ්ඩත්වය තීව්‍ර කිරීමට හේතු වුවත් **ඒවා මගින් ප්‍රචණ්ඩත්වය පාලනය නොවේ.**

**නොකළ යුතු:** වින්දිතයා බීමතින් සිටියේද, රෑ බෝවී එළිමහනේ සිටියේද, තනිවම ගමන් කරමින් සිටියේද, වෙනත් පුද්ගලයන් සමග සම්බන්ධතා ඇතිකර ගෙන සිටියේද යනාදිය ඇතුළත් ව ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කරන්නා වූ හෝ වින්දිතයාට සිදු වූ දේ සම්බන්ධයෙන් අනවධානයෙන් ඔවුන්ට චෝදනා කරන්නා වූ භාෂාව භාවිත කිරීම.

## 4. නීතිය දැන සිටින්න

**කළ යුතු :** යම් යම් ලිංගික අපරාධ සම්බන්ධයෙන්, නිකුත් කරන ලද ආරක්ෂණ නියෝග හෝ දරුවන් සම්බන්ධ වී සිටින විට, ඔබට වාර්තා කළ හැක්කේ කුමක්ද නොහැක්කේ කුමක්ද යන්න ගැන පැහැදිලි කෙරෙන යම් යම් නෛතික පරාමිතීන් ඇති බව දැන සිටින්න. **මෙම සිදුවීම්වල දී මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන ඔවුන්ගේ වගකීම් දැන සිටි යුතු අතර හුදෙක් මෙම මාර්ගෝපදේශන පමණක් පදනම් නොවිය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා ABC හි 2016 guide[1]බලන්න.**

**කළ යුතු:** දැනට අපරාධ සේ නම් කර නොමැති[2], භාවමය හෝ මානසික අපචාර, වියපත් අය හිංසනයට ලක් කිරීම, මූල්‍යමය හිංසන හා බලෙන් පාලනය කිරීම ඇතුළත්ව ප්‍රචණ්ඩත්වයේ විවිධ ස්වභාවයන් ඇති බව අවබෝධ කර ගැනීම හා ඒ සෑම ආකාරයේ හිංමනයක් ම බැරෑරුම් හා ජීවිත අවදානම ඇති කරන සුලු ඒවා බව මතක තබා ගැනීම.

> *"කුටුම්භ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්බව ඉහළ නැංවීමේ ලා මාධ්‍ය විශාල බලපෑමක් කරනවා. මෙම මාර්ගෝපදේශ හඳුන්වා දීම මගින් ප්‍රවෘත්ති ආයතනවලට මෙම සංකීර්ණ ගැටලුව වාර්තා කිරීම උපකාරයක් වේවි"*
>
> **- Andrew Eales,**
> කළමනාකාර කර්තෘ
> Fairfax රීජනල්

---

### නොනැසී සිටින්නන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම

කථාව මගින් එය සම්බන්ධ පුද්ගලයන්ට ඇති විය හැකි බලපෑම ගැන සිතා බලන්න. ඔබේ වාර්තාකරණය හෝ සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීම මගින් ඔවුන් නැවත කම්පනයට ලක් වීම හෝ නොදැනුවත්වම ලැජ්ජාවට පත් වීම සිදු විය හැකිය. ප්‍රචණ්ඩත්වය දැක ඇති හෝ එහි නොනැසී සිටින්නන් වන දරුවන් සමග කතා කිරීම විශේෂයෙන් ම අවදානම් සහගත වන්නට පුලුවන. ඔබ විසින් වාර්තා කිරීමට යෙදෙන කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අනුගමනය කළ හැකි උපක්‍රම කිහිපයක් මෙසේ වේ.

- විවෘත අවසානයක් ඇති ප්‍රශ්න අසන්න. එනම් "සිදු වූ දේ ගැන ඔබට පැවසිය හැක්කේ මොනවාද?"
- ඔවුන්ව හැඳින්විය යුත්තේ හා නම් කළ යුත්තේ කෙසේදැයි අසන්න (උදා වින්දිතයා හෝ නොනැසී සිටින්නා, ආබාධිත කාන්තාව වෙනුවට ආබාධයක් සහිත කාන්තාව, ඔවුන් කැමැති සර්වනාම සහ අදාළ සංස්කෘතික යෙදුම්)
- ඔවුන්ගේ කතාව පැවසීමට ඇති තරම් වේලාව ලබා දෙන්න.
- ඔවුන්ගේ කතාවේ අංග අනාවරණය කිරීමට ඔවුන්ගෙන් අවබෝධාත්මය අනුමැතිය ඇති බව තහවුරු කර ගන්න, එසේ ම හැකි අවස්ථාවල දී ඔවුන් නම් කර ඇති ආකාරය හා ඔවුන් උපුටා දක්වා ඇති අකාරය සමාලෝචනය කිරීමට ඔවුන්ට අවස්ථාවල ලබා දෙන්න.
- නොනැසී සිටින්නන් සිය කතාව පැවසීමේ දී ආරක්ෂාව මෙන් ම ආචාරවිධි සම්බන්ධයෙන් ද ගැටලු ඇති විය හැකි බව දැන සිටින්න. හඳුනාගැනීමේ හා එමගින් පළිගැනීමට ලක්වීමේ අවදානම, එසේ ම සිදුවෙමින් පවත්නා නඩු කටයුතුවලට බලපෑම් සිදුවීම.
- කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට සමග කටයුතු කරන සේවාවලට ඇති සම්පත් ප්‍රමාණය සීමිත බවත් ඒ නිසා කඩිනමින් කතා ඇසීමට වෙන් වූ පුද්ගලයන් නොමැති බවත්, ආරක්ෂාව සම්බන්ධ හේතු නිසා නොනැසී සිටින්නන් මාධ්‍ය සමග සම්බන්ධ වීම දිරිමත් නොකෙරෙන බව අවබෝධ කර ගන්න.
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ජීවිත කාලය මුලුල්ලේ වෙනස් විය හැකි බව දැන සිටින්න. උදාහරණ ලෙස සිය වැඩුනු දරුවන් අතින් අපචාරයට ලක්වන වියපත් කාන්තාවන් දැක්විය හැකිය.
- ප්‍රචණ්ඩත්වය හා නඩු කටයුතු ඇති වූ විට වඩාත් කඩිනමින් ප්‍රතිචාර දක්වන විශේෂිත සේවාවන් සමග සම්බන්ධතා හා විශ්වාසය ගොඩනගා ගන්න.

---

[1] ABC, 2016, http://about.abc.net.au/wp-content/uploads/2016/03/Final-DFV-Fact-Sheet-15-Feb-2016.pdf
[2] Family Violence Prevention Act, 2008

## 5. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සංවේදනීය නොවේ.

**නොකළ යුතු :** ප්‍රචණ්ඩත්වය සංවේදනීයත්වයට පත් කිරීම හෝ අවතක්සේරුවට ලක් කිරීම, අනවශ්‍ය ලෙස නාට්‍යානුසාර භාෂා භාවිතය, අනවශ්‍ය තොරතුරු දැක්වීම, අදාළ නොවන හා disempowering වූ පින්තූර භාවිත කිරීම (*සුදුසු පින්තූර හෝ මාධ්‍ය තොරතුරු භාවිතය සම්බන්ධයෙන් 8 පිටුව බලන්න*), හෝ නුසුදුසු හඳුන්වා දීම් හෝ දෙපිට කැපෙන යෙදුම් භාවිතය. 12 වැනි පිටුවේ 'නරක වාර්තාකරණයේ සිට වඩාත් හොඳ වාර්තාකරණය දක්වා' බලන්න

## 6. අපරාධකරුවා අවධාරණය කරන්න

**කළ යුතු :** කිසියම් පුද්ගලයකු මෙම වින්දිතයාට එරෙහිව වරදක් සිදු කළ බව අවධාරණය වන සක්‍රීය භාෂාත්මය යෙදුම් උපයෝගී කර ගන්න. උදාහරණ ලෙස, කාන්තාවකට පහර දී ඇත යන නිශ්ක්‍රිය ශීර්ෂපාඨය වෙනුවට, පුරුෂයෙක් කාන්තාවකට පහර දෙයි හෝ පුරුෂයෙක් සිය කළින් බිරියට පහර දෙයි වැනි ශීර්ෂපාඨ සළකා බලන්න. එසේ නැත්නම් ප්‍රචණ්ඩත්වය කාන්තාව අරබයා හුදෙක් සිදුවන දෙයක් බවට පෙනී යයි, එහෙත් ඇත්ත වශයෙන් ම ඒ පසුපස අපරාධකරුවකු සිටියි.

> *" beyondblue හා People with Disability Australia වැනි ආයතනවල වාර්තාකරණ භාෂා මාර්ගෝපදේශන ඉතා ඵලදායී බව මට පෙනී ගොස් තිබෙනවා. කුටුම්බ ප්‍රචණ්ඩත්වය වැනි ව්‍යාප්තිත ගැටලුවකදී වාර්තාකරුවන්ට උපරිම වශයෙන් අර්ථවත් ව ගැටලුව ආවරණය කිරීමට මේ ආකාරයේ මාර්ගෝපදේශන තිබීම ඉතා අර්ථවත්"*
>
> \- **Melissa Davey**
> මෙල්බන් කාර්යාල ප්‍රධානි
> Guardian Australia

**කළ යුතු:** නොනැසී සිටින්නා හා අපරාධකරුවා අතර දැනට පවතින හෝ කළින් පැවතුණු සම්බන්ධතාව දක්වන්න. (එවන් සම්බන්ධතාවක් ඇත්නම් හා නෛතිකව එය දැක්විය හැකි නම්) කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය බොහෝ විට ඔවුන් දන්නා හඳුනන කෙනෙක් විසින් සිදුකරන බවත් (එනම් වත්මන් හෝ කළින් සහකරු, වැඩුණු දරුවන්, පවුලේ සාමාජිකයෙක් හෝ රැකවරණ සපයන්නෙක් ආදී අය), නාඳුනන පුද්ගලයන් විසින් සිදුකරන ප්‍රහාරයන් (උදා නාඳුනන පුද්ගලයකු විසින් සිදු කරන ශාරීරික හෝ ලිංගික අතවර) එතරම් සුලබ නැති බවත් ඔබේ ප්‍රේක්ෂකයන්ට සිහිගන්වන්න.

**නොකළ යුතු :** පුරුෂයන්ගේ ප්‍රචණ්ඩත්වයෙන් වැලකී සිටීමට කාන්තාවන් සිය චර්යාවන් පාලනය කර ගත යුතු බවට හෝ වෙනස් කර ගත යුතු බවට වන අදහස් සවිගැන්වීමට කටයුතු කිරීම. දැරියන් හා කාන්තාවන් ආරක්ෂිතව සිටීම වැදගත් වන අතර, ප්‍රචණ්ඩත්වයක වගකීම සෑම විටම එය සිදු කළ අපරාධකරුවා දැරිය යුතුය.

## 7. කතාව සංදර්භගත කරන්න

**කළ යුතු:** ඔබට හැකි අවස්ථාවල දී කථාව සකස් කිරීමට ප්‍රාන්තීය, ජාතික හා ගෝලීය (සුදුසු නම්) දත්ත උපයෝගී කරගන්න. බොහෝ කාන්තාවන් ප්‍රචණ්ඩත්වය ගැන පැමිණිලි නොකරන බවත් එසේ ම සංඛ්‍යාන දත්ත එක්රැස් කිරීම හෝ නොකිරීම හා අවබෝධ කර ගැනීම කතාවේ වැදගත් කොටසක් වන්නට පුළුවන. *දත්තවල ගැටලු* 16 පිටුව බලන්න.

## 8. සෑම විට ම පවතින උපකාර ඇතුළත් කරන්න

**කළ යුතු :**සෑම විට ම ඔබේ ප්‍රේක්ෂක **ප්‍රජාව** තුළ උපකාර සොයමින් සිටින සිටින පුරුෂයන්ට, කාන්තාවන්ට හා දරුවන්ට උදව් කිරීමට අවස්ථාව ලබා ගන්න. නිරන්තරයෙන්, කුටුම්බ ප්‍රචණ්ඩත්වයට ලක් වූවන් වෙනුවෙන් වන විශේෂිත සේවා ගැන තොරතුරු සපයන්න. එනම්, **"ඔබ හෝ ඔබ දන්නා අයෙක් කුටුම්බ ප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳියි නම් 1800 RESPECT අමතන්න"** ආදී වශයෙන්. එසේ ම පුරුෂයන් වෙනුවෙන් ද යොමු කිරීම් ඇතුළත් කරන්න. උදාහරණ ලෙස, **"කෝපය, සම්බන්ධතාවල ගැටලු හෝ දරුවන් හදාවඩා ගැනීම සම්බන්ධයෙන් ගැටලු ඇත්නම් උපදේශනය, අවවාද හා උපකාර සඳහා 1300 766 491 ඔස්සේ Men's Referral Service අමතන්න."**

> *"මගේ සොයුරිය Niki ඝාතනය කරනු ලැබූ විට, මාධ්‍ය වාර්තා බොහොමයක සඳහන් වූයේ ඇගේ සමේ වර්ණය, අපගේ සංස්කෘතික පසුබිම ගැනයි එසේත් නැත්නම් කිසියම් ආකාරයකින් "සංස්කෘතිය" හෝ "ගෞරවය වෙනුවෙන් සිදුකරන මරණ" පිළිබඳ අපරාධය සිදුකළ තැනැත්තා වෙත පැවරී තිබුණු වගකීම නිසා අපරාධයක් සිදු කිරීම සමාවට කාරණයක් සේ දැක්වීමයි. එහෙත් මෙහි දී සිදු වූයේ එක් පුරුෂයකු විසින් කාන්තාවකගේ ජීවිතයක් නැති කිරීමට තීරණය කිරීමයි. අපි මෙම සියලු සාධක ගැන සළකා බලමින් ඒවා නිසා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය විශේෂයෙන් ම යම් යම් ජාතික හා වෙනත් සංස්කෘතික කණ්ඩායම්වලදී වඩාත් බැරෑරුම් වන්නේ, කෙසේ දැයි සොයා බැලීම [අවශ්‍ය වේ.]"*
>
> \- **Tarang Chawla,**
> Our Watch සන්නාමකරු

**නොකළ යුතු** : සියදිවි නසා ගැනීම් හෝ මානසික සෞඛ්‍ය පිළිබඳ විශේෂිත තොරතුරු සපයන සේවාවන් ගැන තොරතුරු සැපයීම. මෙමගින් වක්‍රාකාරයෙන් කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වය නොසළකා ගැනීමක් සිදු කෙරෙන අතර, දැනට ප්‍රචණ්ඩත්වය අත්විඳිමින් සිටින අයට විශේෂිත උපකාර සේවාවලට යොමුවීමට යුහුසුලු කිරීමට ඇති අවස්ථාවක් මග හැරීමක් විය හැකිය.

> *"මෙම මාර්ගෝපදේශන වැඩි දියුණු කිරීමට හා ස්ථාපනය කිරීමට සහය දීම සම්බන්ධයෙන් මාධ්‍යට ඇති සුවිශේෂී කාර්යභාරය මාධ්‍ය විසින් අවබෝධ කර ගැනීම හා එයට අනුකූලවීම වැදගත්ය."*
>
> - **Shaun Gough**, අන්තර්ගත අධ්‍යක්ෂ Triple M, මෙල්බන්

## 9. සුදුසු රූප හා චලන රූප පට භාවිතය

**කළ යුතු::** රූප හා දෘෂ්ටිය කතාවක් පැවසීමේ දී ඉතා වැදගත් වන නමුත් එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, හැකියාව හා වයස සම්බන්ධයෙන් හානිකර ඒකාකෘතිකයන් පවත්වාගෙන යාමට හේතු විය හැකිය. උදාහරණ වශයෙන් 'ඇය බීමතින් සිටි බව', අපයෝජකයාගෙන් ඈත්වෙමින් සිටි බව, 'අනාචාරය', හා 'වගකීම් රහිතබව' පෙන්වන සංකල්ප රූප මෙන් ම 'ඔහු ගුණයහපත් ස්වාමියෙක් බව' පෙන්වන සංකල්ප රූප.

**කළ යුතු:** තෝරාගත් සංකල්ප රූප මගින් (ඔබ සංකල්ප රූප නිර්මාණය කර හෝ ගොනුවකින් සංකල්ප රූප තෝරාගෙන ඇත්නම්) යම් පුද්ගලයකු ගැන කුමන කතාවන් කියවේ දැයි ඔබගෙන් ම අසා බලන්න. ඒ ඔබ නම්, භාවිතයට ගෙන ඇති සංකල්ප රූප ගැන ඔබ සතුටුද? එමගින් පවුලේ සාමාජිකයන් හා හිතමිතුරන් වෙත කිනම් බලපෑමක් ඇති විය හැකිද?

**නොකළ යුතු:** නොනැසී සිටින්නන් හෝ වින්දිතයන් කුඩාවට පෙනෙන සේ ඉහළ කෝණයකින් ඔවුන්ගේ ඡායාරූප ගැනීම, 'කණගාටුවෙන්' සිටින සේ හෝ 'අසරණ' ලෙස සිටින සේ ඔවුන්ගෙන් ඉල්ලා සිටීම එසේම, සමාජ මාධ්‍යවල ඇති නාන ඇඳුමින් සැරසුනු ඡායාරූප උගුලට අසුවීම් - ඔබට සොයාගත හැකි වූයේ එපමණයි නම් එය කපා දැමීම වඩාත් සුදුසුය!

> *"හොඳ මිනිස්සු සිය පවුල් ඝාතනය නොකරති. ඔවුන් සිය බිරියන් හිංසනයට පත් නොකරති. ඔවුහු සිය දූවරුන්ට හා පුත්වරුන්ට හානි නොකරති. එසේ ම ඔවුහු කිසිසේත් ම සිය මුණුබුරු මිනිබිරියන් ඝාතනය නොකරති."*
>
> - **Rebecca Poulson**
> Sydney Morning Herald වෙනුවෙන්

## 10. අදහස් දැක්වීමට විශේෂඥයන්ට ආරාධනා කිරීම

**කළ යුතු :** ගැටලුව සංදර්භගත කිරීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂඥයන් උපුටා දක්වන්න. ඇබොරිජිනල් හා ටෝරස් දූපත්, සංක්‍රමණික හා සරණාගත, LGBTIQ+ ප්‍රජාවන් ඇතුළුව විශේෂිත අත්දැකීම් සහිත, කුටුම්භ ප්‍රචණ්ඩත්ව හා ලිංගික අඩම්තේට්ටම් සේවා, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමට කටයුතු කරන ආයතන හා පර්යේෂකයන්, ලැයිස්තුවක් සඳහා 18 වැනි පිටුවේ *මූලාශ්‍ර බලන්න.* කරන්න.

**කළ යුතු:** අපරාධකරුවන් සම්බන්ධයෙන් අසල්වැසියන්ගෙන් හෝ හිතමිතුරන්ගෙන් අසා දැනගෙන ඔහු ඉතා 'හොඳ ස්වාමියෙක්', 'ආදරණීය පියෙක්' ආදී වශයෙන් වන චරිත සහතික ඇතුළත් කිරීම ගැන ප්‍රවේශම් වන්න. එසේ කිරීම ගැටලුකාරී විය හැකිය, මක් නිසාද යත් කුටුම්භ ප්‍රචණ්ඩත්වය බොහෝ විට රහසේ හා දීර්ඝ කාලයක් තිස්සේ සිදු වන්නකි.

**නොකළ යුතු:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ දී පොලිසියේ හෝ නෛතික පද්ධතියේ අදහස් දැක්වීම් මත පමණක් රැඳී සිටින්න. වාර්තා වූ අපරාධයක් සම්බන්ධයෙන් ඉතිහාසය දැක්වීමට පොලිසියට හැකි වුවත්, කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය බොහෝ විට අපරාධ නොවූවත් ඒවා හුදෙක් "සිදුවීමක්" පමණක් නොවන අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බොහෝ විට වාර්තා නොවේ.

> "මෙම අංග නොමැතිව, සිදුවීම හුදෙකලා හා අහඹු සිදුවීමක් ලෙස පෙනී යා හැකිය. මෙමගින් වගකීම තනි පුද්ගලයන් මත ද විසඳුම නෛතික පද්ධතිය මත ද පැවරී ඇත. එය වෙනත් අයෙකුගේ ගැටලුවක් සේ දැක නොසළකා හැරීමට මේ නිසා ඉඩ සැලසී තිබේ."
>
> - **Annie Blatchford**, The Conversation

## ३. ග ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී කාන්තාවන් විසින් අත්විඳින ලද ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම

විශේෂයෙන් ම ඇබොරිජිනල් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ දී ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසීන් වැරදියට අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇති බව පිළිගැනීම ඉතා වැදගත් වේ.

### රාමුගත කිරීම හා සංදර්භය වැදගත්ය

- ඇබොරිජිනල් කාන්තාවකගේ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අත්දැකීම් සන්දර්භයේ දී ජාතිවාදය, පැහැර ගැනීම්, අන්තර් පාරම්පරික කම්පනයන් හා මුල්බැස ගෙන ඇති දරිද්‍රතාව ඇතුළු යටත් විජිතවාදයේ පුළුල් බලපෑම් ගැන අවබෝධයකින් සිටීම වැදගත්ය. මක් නිසාද යත්, සිය දරුවන් තමන්ගෙන් ඉවත් කර ගන්නා බවට ඇති බිය හා රජයේ ආයතන සම්බන්ධයෙන් ඇති අවිශ්වාසය ඇබොරිජිනල් කාන්තාවකට උපකාර සෙවීම හෝ සේවාවලට ප්‍රවේශ වීම වඩාත් දුෂ්කර කරයි.
- ගැටලුව සම්බන්ධයෙන් ප්‍රජා මූල විසඳුම් හා ප්‍රවේශයන් ඇතුළත් කිරීම ගැන සළකා බලන්න. (උදා ප්‍රජාව තුළ සිටින ඇබොරිජිනල් හා ටෝරස් දූපත් වාසී නායකයන්, නීති සංශෝධන, ප්‍රජාව මගින් පාලනය කෙරෙන කුටුම්භ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට හෝ පිටු දැකීමට කැප වූ වැඩසටහන්)

> *"ප්‍රචණ්ඩත්වය හා ගැටලු පැමිණෙන්නේ කොහෙන්දැයි යන්න මෙන් ම එම ගැටලු යටත් විජිත වාදයේ, අවාසිය හා දරිද්‍රතාවේ ලක්ෂණ මිස ජාතියේ හෝ සංස්කෘතියේ ලක්ෂණ නොවන බව මාධ්‍යවේදීන් අවබෝධ කරගෙන සිටිය යුතුය. එය අවබෝධ කර ගැනීමට නම් පුද්ගලයන් ඔස්ට්‍රේලියානු ඉතිහාසය දැන සිටිය යුතුය."*
>
> **– Paul Daley,**
> Walkey-ජයග්‍රාහක මාධ්‍යවේදී,
> ග්‍රන්ථ කතෘ හා නාට්‍ය රචක

### හානිකර ඒකාකෘතිකයන්

කතාව තුළ අන්තර්ගතව තිබිය හැකි උපකල්පන ගැන සිතා ඔබෙන් ම මෙසේ අසන්න:

- මම (රූප, භාෂාව හා දත්ත) මගින් ඍණාත්මක ඒකාකෘතික පවත්වාගෙන යන්නේද? උදාහරණ ලෙස, ඇබොරිජිනල් භාවය ප්‍රචණ්ඩත්වය ඇති කරනවාද එයට දායකවනවාද, එසේත් නැත්නම් එම ඇබොරිජිනල් වරු සියල්ලෝ ම මත් ද්‍රව්‍ය හා මත්පැන් ගැටලු ඇති අයද?
- මෙය හුදෙක් ඇබොරිජිනල්වරුන්ගේ ගැටලුවක් සේ නොදක්වමින් මම, ඇබොරිජිනල් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නම් වූ ගෝලීය ගැටලුවට සම්බන්ධ කර ඇත්ද?
- ආදී වාසී නොවන පුරුෂයන් පවා වගකිවය යුත්තන් වන බව ( නාගරික ප්‍රදේශවල බොහෝ විට දී වගකිව යුතු බව) සිතේ තබා ගෙන, අපරාධකරුවාගේ ජාතිකත්වය ගැන මා උපකල්පන සිදුකර තිබේද?
- ප්‍රචණ්ඩත්වය ඇති වීමට සංස්කෘතිය, මත්පැන් හා කාන්තාවන්ගේ හැසිරීම හේතුවන බව වක්‍රාකාරයෙන් සඳහන් කරමින් මා චෝදනා කර තිබේද?

### සංස්කෘතික චර්යා විධි

- මෙම විශේෂිත ඇබොරිජිල් ප්‍රජාවෙ හි නම් කිරීම හෝ මියගිය පුද්ගලයකු ගේ රූප භාවිත කිරීම ගැන වන සංස්කෘතික චර්යා විධි සම්බන්ධයෙන් ඔබ ප්‍රජා සාමාජිකයන්ගේ අවවාද ලබා ගත්තාද?
- ඔබ වාර්තා කරන ප්‍රදේශයේ ප්‍රජාවන් ගැන වැඩිදුර අධ්‍යනය කර ඔබේ සංස්කෘතික ශක්‍යතාව[3] වැඩි දියුණු කර ගැනීමට ඔබට හැකිද??

### ඔබේ මූලාශ්‍ර මොනවාදැයි සළකා බලන්න

- සමස්ත ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී ප්‍රජාව වෙනුවෙන් වන 'එක් හඬක්' නොමැති බව අවබෝධ කර ගන්න.
- ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී ප්‍රජාව පිළිගත් නායකයකු හෝ විශේෂඥයකු ලෙස සළකන්නේ කවුරුන්දැයි යන්න සම්බන්ධයෙන් *ඔවුන්ගෙන්* උපදෙස් ගන්න.
- ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී කාන්තාවන් ගැන සඳහන් කරන ඔබේ කතාවල ඔවුන් ඍණාත්මක ලෙස නොදක්වමින් හැකි සෑම අවස්ථාවක දී ම මෙම ගැටලුවෙහි ලා ඔවුන්ගේ නායකත්වය හා ඔවුන් සතු බලය අවධාරණය කරන කාන්තා හඬ යොදා ගන්න.
- ඔබේ සම්බන්ධතා හා සම්පත්දායකයන් සමග සම්බන්ධතා හා විශ්වාසය ගොඩනගා ගැනීමට කාලය වැය කරන්න. ඓතිහාසික වශයෙන් මාධ්‍ය සම්බන්ධයෙන් කතා කරන විට, වාර්තාකරණය නිසා ප්‍රජාව තුළ අවිශ්වාසය ඇති වී ඇත.

---

[3] මෙම අධ්‍යයනයන් සඳහා Koorie Heritage Trust වැනි සංවිධානවලට උපකාර කළ හැකිය.

| අයහපත් වාර්තාකරණ | යහපත් වාර්තාකරණය[4] |
|---|---|
| **ශීර්ෂපාඨය :** මරා දැමුණු මව ..... අයිස් භාවිත කරන්නියක්, 'ඇගේ දරුවන්' 'හාමත් කර 'පහරදීලා'<br><br>**ගැටලුව:** අපරාධකරුවා විසින් කාන්තාව හා ඇගේ දරුවන් මරා දමා තිබීම අවධාරණය කරනු වෙනුවට, මෙම ලිපිය, වින්දිතයාගේ දරුවන් වැඩීම, මත්ද්‍රව්‍ය චෝදනා හා ළමා ආරක්ෂණය සමග ඇති සම්බන්ධතාව අවධාරණය කරයි. තමාගේ මෙන් ම දරු දෙදෙනාගේ ද ඝාතනවලට කාන්තාව වගකිව යුතු බව මෙමගින් වක්‍රාකාරව අඟවයි. | **ශීර්ෂපාඨය :** අපි නියම කාන්තාවන්, අපට ඇවැසි නිදහසේ දිවි ගෙවීමටයි<br><br>**සාර්ථකත්වය:** Miki Perkins' ගේ වාර්තාකරණය මගින් ප්‍රචණ්ඩත්වය ප්‍රතිස්ථාපනය කරන්නා වූ යටත් විජිත වාදය, අහිම වීම හා දිගින් දිගට ම සිදුවන අනර්ථ පිළිබඳ පුළුල් සංදර්භය තුළ හිඳිමින් ඇබොරිජිනල් කාන්තාවන් අත්විඳින විසමානුපාතික ප්‍රචණ්ඩත්ව මට්ටම්වලට අවධානය යොමු කර ඇත. |

## 4. නරක වාර්තාකරණයේ සිට වඩාත් හොඳ වාර්තාකරණය දක්වා ඕස්ට්‍රේලියාවෙන් හා ලෝකයෙන් උදාහරණ

ඕස්ට්‍රේලියාවෙන් හා ලෝකයෙන් කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාවලින් වටිනා යමක් ඉගෙනීමට පහත බලන්න.

| නරක | ගැටලුව | සාක්ෂි | වඩාත් හොඳ |
|---|---|---|---|
| 'සමූහ දූෂණයට ලක් වූ වින්දිතයා බීමත්ව ඉඳලා' | විවින්දිතයා මත්පැන් භාවිත කර සිටි බව කතාවට අදාළ නොව අතර එමගින් වක්‍රාකාරයෙන් දූෂණයට ලක් වීමට ඇය වගකිව යුතු බව අඟවයි.<br><br>මෙම ශීර්ෂපාඨය මගින් අපරාධකරුවන් මකා දමා ඇති අතර සමස්ත අවධානය ප්‍රචණ්ඩත්වයෙන් නොනැසී සිටින්නා වෙත යොමු කර තිබේ. | වින්දිතයාට චෝදනා කිරීමෙහි බහුවිධ අයහපත් බලපෑම් වේ. එනම්, අඩු සානුකම්පාව හා සහයෝගය, අඩු මැදිහත් වීම්, වඩාත් දුර්වල සෞඛ්‍ය අතුරුඵල, උසාවිවලින් අයහපත් ම වන්දි ලැබීම ආදිය. එමෙන් ම මෙහිදී කාන්තාවන්ට හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කෙරෙන දේ ගැන සඳහනක් නොවේ. | 'ගැටවර තරුණියක් සමූහ දූෂණය කිරීම ගැන වැඩිහිටි පුරුෂයන් තිදෙනෙකුට චෝදනා' |
| මරා දැමුණු කාන්තාව "'රති කෙළියක්' අවසානයේ ලේ ගොස් මැරෙන්නට හැරලා" | ඇබොරිජිනල් කාන්තාවක වන Lynette Daley ගේ අමානුෂික දූෂණය හා ඝාතනය සම්බන්ධ වාර්තාකරණයන් හි දී ඇගේ තුවාල ගැන විස්තරාත්මක හා සංවේදනීය තොරතුරු ඇතුළත් විය. මෙම ලිපිය මගින් දූෂණ චෝදනාවක් 'සාවද්‍ය' හා 'අසාධාරණ' ලෙස රති කෙළියක් සේ දක්වා තිබීම මගින් ඕස්ට්‍රේලියානු මාධ්‍ය කවුන්සිලයේ සම්මතයන් උල්ලංඝනය කර ඇති බව අනාවරණය විය. | දීර්ඝ කාලයක් තිස්සේ ඇබොරිජිනල් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මාධ්‍ය වාර්තාකරණයේ දී අවමකරණය, සාධාරණීකරණය හෝ 'අදිසිකරණය' සිදුවෙමින් පැවතුනි. චෝදනා ලත් දූෂණය සඳහන් කිරීමට අපොහොසත් වීමෙන්, මෙම ලිපිය මගින් වගකීම අපරාධකරුවන්ගෙන් ඉවතට යොමු කිරීම හා අනුමැතිය රහිතව අමානුෂික ලෙස සිදු වූ Lynette Daley ගේ දූෂණය හා ඝාතනය නොසළකා හරියි. | 'අමානුෂික ලෙෂ දූෂණය කර මරා දැමුණු Lynette Daley ට සාධාරණය ඉටු කිරීමේ ව්‍යාපාරය' |
| 'බිඳුනු හදවත් නිසා ඇති වූ ප්‍රචණ්ඩත්වය' | කථා කළ නොහැකි ප්‍රචණ්ඩත්වය අවබෝධකර ගැනීමට ප්‍රජාව විසින් මග සොයමින් සිටියි, එහෙත් ප්‍රචණ්ඩත්වය යටින් දිවෙන පාලන ගැන අවබෝධයක් ලබා දෙනු | , හදවත බිඳීමට මානසික සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් කාන්තාවන්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වයට චෝදනා කිරීම සාක්ෂි පාදක නොවන අතර එය කුටුම්භ | 'කථා කළ නොහැකි තරම්වන ප්‍රචණ්ඩත්වය අපරාධකරුවා විසින් පාලනය කර ගත යුතුය' |

[4] වැඩිදුර තොරතුරු සඳහා *Reporting on Aboriginal People's Experiences of Family Violence* (2018) බලන්න

| | | | |
|---|---|---|---|
| | වෙනුවට අපරාධකරුවාට මුහුණපෑමට සිදු වූ දුෂ්කරතා ගැන වාර්තා කර තිබේ. | ප්‍රචණ්ඩත්වය පිළිබඳ වික්ටෝරියානු රාජකීය කොමිසමේ සොයාගැනීම්වලට පටහැනිය. | |
| මරා දැමුණු කාන්තාව 'පිරිමි ගැහැණිය' (shemale) ලෙස දැක්වීම | සංක්‍රාන්ති ලිංගික කාන්තාවක් වන Mayang Prasetyo ඇගේ ස්වාමිපුරුෂයා වන Marcus Volke විසින් අමානුෂික ලෙස ඝාතනය කරනු ලැබූ විට, සමහර මාධ්‍ය වාර්තා ප්‍රචණ්ඩත්වය පිළිබඳ අනවශ්‍ය හා විස්තරාත්මක තොරතුරු අවධාරණය කරමින්, නාන ඇඳුමින් සැරසුණු ඡායාරූප යොදා ගෙන ඇගේ ලිංගිකත්වය හුවා දක්වමින් සහ ඇගේ ලිංගික සේවා හා පෞද්ගලික ජීවිතය ගැන සොයා බලමින් ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමේ හෝ අවබෝධ කර ගැනීමේ උත්සාහයක නියැලුනි. | සංක්‍රාන්ති ලිංගික, බහුවිධ ලිංගික, සමරිසි හා ද්විරිසි සේ හඳුනාගැනෙන කාන්තාවන් අසාධාරණයට ලක්වන අතර විශේෂයෙන් ම ප්‍රචණ්ඩත්වයට ඉලක්ක වේ.<br><br>සියලු කාන්තාවන්ට, හානිකර ඒකාකෘතිකයන් පවත්වාගෙන නොයන්නා වූ අපක්ෂපාතී මාධ්‍යවල උපකාර අවශ්‍යය. | 'පුරුෂයා අමානුෂික ලෙස කාන්තාව මරා දමයි'<br><br>Mayang Prasetyo ගේ ලිංගික නැඹුරුව, වෘත්තිය, වෛද්‍ය ඉතිහාසය හා ඉපදුනු රට යනාදිය ප්‍රචණ්ඩත්වය ඇති වීමට හේතු නොවේ - එයට හේතු වූයේ ප්‍රචණ්ඩත්වය තෝරා ගැනීමට ඇගේ ස්වාමිපුරුෂයා ගත් තීරණයයි. |
| 'නැටුම් බිමේ මිනී මැරුම' | Arman Abrahimzadeh ගේ පියා විසින් ඔහුගේ මව 300ක පිරිසක් ඉදිරියේ අමානුෂික ලෙස මරා දැමුනි.<br><br>ඔහුගේ මවගේ මරණයෙන් පසු ඔස්ට්‍රේලියානු මාධ්‍ය වාර්තා කළේ ඔහුගේ මුස්ලිම් සම්භවය නිසා ඝාතනය කුමන ආකාරයකින් හෝ සංස්කෘතියට සම්බන්ධ බවයි.<br><br>ශීර්ෂපාඨය මගින් ජනප්‍රිය පොප් ගීයක් දක්වා තිබීම අනවශ්‍ය මෙන් ම ගෞරවණීය නොවේ. | Arman පැහැදිලි කළ ආකාරයට :<br>"අපේ අම්මාගේ මරණය පත්තර විකුණන්න නාට්‍යානුසාර කළ යුතු දෙයක් නෙමෙයි. තාත්තාගේ ප්‍රචණ්ඩත්වය සංස්කෘතික හෝ ආගමික වටිනාකමක් නිසා ඇති වූ දෙයක් නෙමෙයි. ඒ වගේ ම ඒ ඔහුට ඇති වූ 'ක්ෂණික කෝපය' නිසාත් නෙමෙයි.<br><br>"මගේ අම්මාගේ මරණය අපි සිටින සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඇති අසමතුලිතාව, තාත්තා, මගේ අම්මාව, සහෝදරියන්ව හා මාව ඔහුට අයිති දේ වශයෙන් දැකීම නිසා සිදු වූවක්." | 'වසර ගණනාවක අපයෝජනවලින් පසු මිනිසෙක් සිය බිරිඳ මරා දමයි.' |

## 4ශ සුලබ දුර්මත

කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ සළකා බලන විට බොහෝ දුර්මත පවතියි:

| දුර්මතය | යථාර්ථය |
|---|---|
| මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය, මානසික සෞඛ්‍ය ගැටලු හෝ ආතතිය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට හෝ ඇති කිරීමට හේතු වේ. | මෙම ගැටලු නිසා ප්‍රචණ්ඩත්වය තීව්‍ර වුවත් ඒවා ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට හෝ ඇති කිරීමට හේතු නොවේ. |
| පුරුෂයන් 'ක්ෂණිකව කෝප ගැනීම' හෝ යම් දෙයකින් (ආරවුලක්) 'එක්වරම' ප්‍රචණ්ඩත්වය ඇති කරයි. | පර්යේෂණ මගින් පෙන්වා දී ඇති අන්දමට, සිය සහකාරියන් ඝාතනය කරන පුරුෂයන්ගෙන් අති මහත් බහුතරයකට (සියයට 80ක්) ම සිය සහකාරියන් අපයෝජනයට ලක් කිරීම සම්බන්ධයෙන් වන ඉතිහාසයක් වේ. |
| කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වයට කාන්තා රෝෂය/ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතා හේතු නොවේ. | කාන්තාවෝ අති බහුතරයක් කුටුම්භ ප්‍රචණ්ඩත්වයේ හා ලිංගික හා ශාරීරික අඩම්තේට්ටම්වල (ABS, 2016) වින්දිතයන් සේ සිටිති. මක්නිසාද යත් ඔවුන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් ව ඔවුන් ප්‍රචණ්ඩත්වයට ඉලක්ක වන බැවිනි. පුරුෂයන් අති බහුතරයක් අපරාධකරුවන් සේ සිටීම සිදු වේ. |
| කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කලාතුරකින් සිදුවන්නක් හා පුරෝකථනය කළ නොහැකි එකක් වේ. | ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන අන්දමට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පුරෝකථනය මෙන් ම පිටුදැකීම සිදු කළ හැකිය. සමස්ත ඔස්ට්‍රේලියාව තුළ සෑම මිනිත්තු දෙකකට ම වරක් කුටුම්භ ප්‍රචණ්ඩත්ව සිදුවීමක් සම්බන්ධයෙන් පොලිසිය ඇමතීම සිදු වේ. එසේ ම අවුරුදු 15- 44 දක්වා කාන්තාවන්ගේ දුර්වල සෞඛ්‍යය හා අකාලික මරණයට වැඩිම දායකත්වයක් දරණ හේතුව කුටුම්භ ප්‍රචණ්ඩත්වයයි. (VicHealth, 2018). |
| සමහර සංස්කෘතීන් හා සමාජ ආර්ථික කණ්ඩායම් අනෙක් ඒවාට වඩා ප්‍රචණ්ඩ වේ. | අසාධාරණයට ලක් වීම නිසා සමහර සංස්කෘතිවලට අයත් හා පහළ සමාජ ආර්ථික කණ්ඩායම්වල කාන්තාවන් විසමානුපාතික ලෙස ප්‍රචණ්ඩත්වයට ලක් වීම සිදුවිය හැකි නමුත් එම කණ්ඩායම්වල අපරාධකරුවන් වඩාත් ප්‍රචණ්ඩය යන්න සාවද්‍ය මෙන් ම හානිකර මතයකි. වාර්තාකරණය මගින් නිතරම ඇඟවෙන ආකාරයට ඇබොරිජිනල් කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සිදු කරන්නේ ඇබොරිජිනල් පුරුෂයන් පමණක් වන අතර, ඇබොරිජිනල් නොවන පුරුෂයන් විසින් සිදු කරන ප්‍රචණ්ඩත්වය නොසලකා හැරේ. විශේෂයෙන් ම නාගරික ප්‍රදේශවල (Our Watch, 2018).<br><br>අනෙක් අතට, තාවකාලික වීසාවල සිටින කාන්තාවන් ඔස්ට්‍රේලියානු පුරවැසියන් ඇතුළු සියලු සංස්කෘතික පසුබිම්වලට අයත් සහකරුවන් අතින් ප්‍රචණ්ඩත්වයට ලක්වන බව අපි දැන සිටිමු. |
| කාන්තාවෝ නිරතුරුව ලිංගික අඩම්තේට්ටම් හා ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් බොරු කියති. | කුටුම්භ ප්‍රචණ්ඩත්වය හා ලිංගික අඩම්තේට්ටම් සම්බන්ධ ව්‍යාජ චෝදනා සිදු වන්නේ ඉතාමත් කලාතුරකිනි. (AIFS, 2013) එසේ ම දැනට සිටින සහකරුවා අතින් ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන්ගෙන් සියයට 80ක් (ABS, 2012) හා ලිංගික අඩම්තේට්ටම් අත්විඳින කාන්තාවන්ගෙන් සියයට 80ක් අදාළ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි නොකරති. (ABS, 2006). |

| | |
|---|---|
| "අවශ්‍ය නම්" ප්‍රචණ්ඩත්වය ඇති කරන අවස්ථාවක් හැර යාමට කාන්තාවට පුලුවන. | මරා දැමීම ඇතුළු වඩාත් ම තියුණු ප්‍රචණ්ඩත්වය ඇති වන්නේ කාන්තාවක් සම්බන්ධතාව හැර යාමට උත්සාහ කරන විටය.<br><br>කාන්තාවක් සිය තෝරා ගැනීම නිසා ප්‍රචණ්ඩත්වයේ වින්දිතයකු වී සිටි බව ඇඟවීමෙන්, අපරාධකරුවාට එල්ලවන චෝදනාව වෙනතකට යොමු වේ.<br><br>කාන්තාවන් ප්‍රචණ්ඩත්වය පැමිණිලි නොකිරීමට හා හැර නොයාමට හේතු ගණනාවක් පැවතිය හැකිය.<br><br>● තමාගේ/තම දරුවන්ගේ ජීවිත සම්බන්ධයෙන් ඇති බිය (මෙය ගර්භනී කාන්තාවන් සම්බන්ධයෙන් ඉහළ අවදානමක් ගනියි)<br>● සංස්කෘතිකමය අපේක්ෂා හා නෑදෑ හිතමිතුරන්ගෙන් එල්ලවන පීඩනය<br>● පලා ගොස් ජීවත් වීමට තරම් නිවාසයීය හෝ මූල්‍යමය වශයෙන් සම්පත් නොවීම<br>● විශේෂිත උපකාර සේවා හෝ කඩිනම් නිවාස, වීසා තත්ත්වයන් ගැන තොරතුරු, භාෂා හා භූගෝලීය වශයෙන් වන බාධක (උදාහරණ ලෙස ග්‍රාමීය හා දුරස්ථ පළාත්වල ජීවත් වීම.)<br>● ජාතිවාදය හෝ අසාධාරණය ලක් වීම වැනි පූර්ව අත්දැකීම් නිසා පොලිසිය හා වෙනත් ආයතනය විශ්වාස කිරීමට දුෂ්කර වීම හා ප්‍රචණ්ඩත්වය වාර්තා කළ හොත් සිය දරුවන් අහිමි වෙතැයි යන බය<br>● ඔවුන් සිය හිංසකයන්ගෙන් යැපෙන නිසා හැර යාම දුෂ්කරවීම (උදාහරණ ලෙස දුබලතා සහිත කාන්තාවන් හා වියපත් කාන්තාවන් දැක්විය හැකිය.) |

## 3. ග ග තොරතුරු හා දත්ත

### සංඛ්‍යා ලේඛන

#### වික්ටෝරියාවේ

- 2017 - 18 දක්වා කාල සීමාව තුළ:
  - එක් එක් මාසය තුළ කුටුම්භ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් 5690 හා 7127 අතර වාර්තා වී ඇත.
  - කුටුම්භ ප්‍රචණ්ඩත්වයේ බලපෑමට ලක් වූ වික්ටෝරියානුවන්ගෙන් සියයට 75ක් එනම් 76,125ක් කාන්තාවෝ වූ අතර ඔවුන්ගෙන් බහුතරයක් (සියයට 71.5ක්) අවුරුදු 20 - 49 වයසේ පසු වූහ.
  - එම ප්‍රචණ්ඩත්වය සිදු කළ අපරාධකරුවන් අතරින් සියයට 76'2ක් පුරුෂයෝ වූහ.
- ඇබොරිජිනල් වික්ටෝරියානුවන් කුටුම්භ ප්‍රචණ්ඩත්ව සිදුවීම් වාර්තාකරණයේ දී අධි නියෝජනයක් පෙන්නුම් කරන අතර එය බලපෑමට ලක් වූ පවුල් සාමාජිකයකු සේ හතර ගුණයකුත් චෝදනා ලත් වරදකරුවකු සේ පස් ගුණයකුත් වේ. ඇබොරිජිනල් ජනගහනය වික්ටෝරියානු ජනගහනයෙන් සියයට එකක් පමණක් වුවත්, පසුගිය වසර දහය පුරාවට බලපෑමට ලක් වූ පවුල් සාමාජිකයා ලෙස වන වාර්තාවලින් සියයට හතරක් (21,401) හා චෝදනා ලත් වරදකරුවා ලෙස වන වාර්තාවලින් සියයට පහක් (25,666) ඇබොරිජිනල් ප්‍රජාවන්වලින් ලැබී ඇත. (Victorian Aboriginal Affairs Report, 2017)
- ගෝලීය අධ්‍යයනයන්ගෙන් අනාවරණය වන අන්දමට, වැඩිහිටි වික්ටෝරියානුවන් සය දෙනෙකුගෙන් කෙනෙක් (150,000 පමණ) වියපත් හිංසනයේ බලපෑමට ලක් වී සිටියි. (Seniors Rights Victoria, 2018), වියපත් පුද්ගලයන්ට එරෙහිව සිදු කරන සියලු අපරාධ අතරින් අඩකට ආසන්න ප්‍රමාණයක් කුටුම්භ ප්‍රචණ්ඩත්ව සන්දර්භය තුළ සිදු වෙමින් පවතියි. (Alastair Goddell, Victoria Police, 2018)
- වික්ටෝරියාවේ, නිවෙස් අහිමි අය වෙනුවෙන් වන විශේෂිත සේවා (specialist homelessness services) වෙත යොමු වූ අය අතරින් සියයට 38ක් කුටුම්භ ප්‍රචණ්ඩත්වය හැර යන අය වූහ. එය ජාතික මට්ටමේ දී සියයට 33ක් විය.

### ඔස්ට්‍රේලියාව තුළ

- සාමාන්‍යයෙන් එක් සතියක් තුළ එක් කාන්තාවන් ඇගේ වත්මන් හෝ කලින් සහකරුවා විසින් ඝාතනය කෙරෙනු ලැබේ. (AIHW, 2018)
- ඔස්ට්‍රේලියානු කාන්තාවන් තුන් දෙනෙක්ගෙන් එක් අයෙකු ශාරීරික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇත.(ABS, 2017)
- ඔස්ට්‍රේලියානු කාන්තාවන් පස් දෙනෙක්ගෙන් එක් අයෙකු ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇත. (ABS, 2017)
- කාන්තාවන් සිය සමීපතම සහකරුවන් අතින් ප්‍රචණ්ඩත්වයට ලක් වීම, පුරුෂයින් සිය සමීපතම සහකරුවන් අතින් ප්‍රචණ්ඩත්වයට ලක් වීම මෙන් තුන් ගුණයකි. (ABS, 2017)
- LGBTIQ+ඔස්ට්‍රේලියානුවන් අතරින් එක් අයෙක් සමරිසි හිංසනය ශාරීරික ලෙස අත්විඳ ඇත. (Australian Human Rights Commission, 2014)
- ආබාධ සහිත කාන්තාවන් හා දැරියන් ප්‍රචණ්ඩත්වය අත්විඳීමට ඇති අවදානම, අබාධයන් නොමැති සම කණ්ඩායමට සාපේක්ෂව දෙගුණයක් වේ. (Women with Disabilities Victoria, 2013)
- 2017 වර්ෂයේ දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිසා දිවි අහිමි වූ කාන්තාවන් 49 දෙනා අතරින් තුනෙන් එකක් ම වයස අවුරුදු 60න් ඉහළ කාන්තාවෝ වූහ. (Counting Dead Women Australia 2018)
- කුටුම්භ ප්‍රචණ්ඩත්වය නිසා රෝහල්ගත කිරීමට සිදුවන ඇබොරිජිනල් කාන්තාවන් ප්‍රමාණය අනෙක් කාන්තාවන්ට සාපේක්ෂව 35 ගුණයකින් වැඩිය. ඇබොරිජිනල් ඝාතනවල වින්දිතයන් පස් දෙනෙක් අතරින් සෑම දෙදෙනෙක් ම (සියයට 41ක්) වත්මන් හෝ හිටපු සහකරු විසින් සිදු කරන ඝාතනවල වින්දිතයෝ වූහ. එම ප්‍රමාණය ආදීවාසී නොවන වින්දිතයන්ගේ එම ප්‍රමාණය (සියයට 22) මෙන් දෙගුණයක් විය. (AIHW 2018)
- සමරිසි හෝ ද්විරිසි ලෙස හඳුනාගැනෙන කාන්තාවන් එසේ නොවන කාන්තාවන්ට සාපේක්ෂව කුටුම්භ ප්‍රචණ්ඩත්වය අත්විඳීම ඉහළ මට්ටමක පවතියි. (de Visser et al. 2014)

### දත්තවල ගැටලු

අප සතුව පවතින බොහෝ විස්තීරණ දත්ත, Australian Bureau of Statistics (ABS) විසින් සිදුකරන ලද පුරුෂයන් මෙන් ම කාන්තාවන් විසින් අත්විඳින ලද ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය මෙන් ම ප්‍රමාණය ගැන තොරතුරු එක්රැස් කෙරුණු පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ සමීක්ෂණය මගින් ලබා ගත් දත්ත වන අතර වාර්තා වූ අපරාධ සංඛ්‍යා දත්ත නොවේ.

වාර්තාකරන ලද අපරාධ පිළිබඳ සංඛ්‍යා දත්තවලින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා කීදෙනෙක් ප්‍රචණ්ඩත්වයට මුහුණපානවාද යන්න ගැන අපට අවබෝධයක් ලබා නොදේ. මක් නිසාද යත්, ප්‍රචණ්ඩත්වය අත්දකින බොහෝ දෙනෙක් එය පොලිසියට පැමිණිලි නොකරන නිසාය.

එසේ ම, බහුවිධ වූ අසාධාරණකම් හා පීඩාවන්ට මුහුණපාන කාන්තාවෝ (උදාහරණ වශයෙන් ඔවුන්ගේ ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික නැඹුරුතාව, ශාරීරික හෝ මානසික හැකියාව හෝ වයස) අනෙක් කාන්තාවන්ට වඩා ප්‍රචණ්ඩත්වයට මුහුණපෑමට වැඩි අවදානමක සිටිති. එසේ වුවත්, ඔවුන් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමට යොමු වීම හෝ සුදුසු ප්‍රතිචාර හෝ උපකාර ලබා ගැනීමට යොමු වීම වඩාත් අඩුය.

අප තුළ **අවබෝධාත්මකව ම ඇති පක්ෂපාතීත්වයන්** ද සංඛ්‍යා දත්ත වැරදි ලෙස අර්ථකථනය කිරීමට පෙලඹවීමට හැකි බව දැන සිටීම අවශ්‍යය. උදාහරණයක් වශයෙන් ඇබොරිජිනල් හා ටෝරස් දූපත් වාසී කාන්තාවන් කුටුම්භ ප්‍රචණ්ඩත්වය අත්විඳින මට්ටම සෙසු කාන්තාවන්ට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතියත්[5], පොදු කතිකාවත හා මාධ්‍ය වාර්තාකරණය මගින් මෙම ප්‍රචණ්ඩත්වය ඇති කරන්නේ ඇබොරිජිනල් පුරුෂයන් පමණක්ය යන්න ඇඟවීමට ඉඩ ඇත. ඇත්ත වශයෙන් ම ආදී වාසී නොවන පුරුෂයන් ද මෙම ප්‍රචණ්ඩත්වයට වගකිව යුතු වෙති. (නාගරික ප්‍රදේශවල බහුතර වශයෙන් වගකිව යුතු වේ (Our Watch, 2018))

[5] සියලු ආකාරයන් හි ප්‍රචණ්ඩත්වයන් සෘජුව සන්සන්දනය කෙරෙන අන්දමේ එක් දත්ත මූලාශ්‍රයක් නොවේ. කෙසේ වෙතත් ඇබොරිජිනල් හා ටෝරස් දූපත්වාසී කාන්තාවන් ආදි වාසී නොවන කාන්තාවන්ට සාපේක්ෂව ඉහළ මට්ටමක (බොහෝ විට ඉතාම ඉහළ මට්ටමක) ප්‍රචණ්ඩත්වයක් අත්විඳින බව විවිධ වූ දත්ත මූලාශ්‍රවලින් ඒකාකාරීව පෙන්වා දෙයි. මෙය ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය, දත්ත මූලාශ්‍රය හා අධිකරණ පාත්‍රතාව අනුව සැළකිය යුතු වෙනසක් පෙන්වයි. 2014 - 15 වසරවල කුටුම්භ ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ පහර දීම් නිසා රෝහල්ගත කෙරුණු ඇබොරිජිනල් හා ටෝරස් දූපත් කාන්තාවන් ගණන කාන්තා ජනගහනයෙන් 100 000කට කාන්තාවන් 530ක් විය. ජනගහනයේ වයස් ව්‍යුහය අනුව, වෙනස්කම් සකස් කිරීමෙන් අනතුරුව මෙය ආදි වාසී නොවන කාන්තාවන්ගේ අනුපාතය මෙන් 32 ගුණයක් විය.මූලාශ්‍ර :රජයේ සේවා විධිවිධාන සමාලෝචනය සඳහා වන නියමු කොමිසම (2016) ආදිවාසී වීමේ අවාසිය මැඩපැවැත්වීම: ප්‍රධාන දර්ශක 2016, ඵලදායීතා කොමිසම, කැන්බරා, පිටු 4.98 හා වගුව (වගුව 4A.12.13)

## 5. කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ බලපෑම්

කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිසා ඇති වන බලපෑම් විවිධ, ගැඹුරු හා දීර්ඝ කාලීන විය හැකිය. ප්‍රචණ්ඩත්වය නිම වී වසර ගණනාවක් යන තුරු නොනැසී සිටින්නන්ට උපකාර අවශ්‍ය වන්නට පුලුවන. ඒ නිසා ඒ හා සම්බන්ධ වූ සමාජ, සෞඛ්‍ය හා ආර්ථික ගැටලු ගණනාවක් පවුල්වලට හා ප්‍රජාවන්ට අවසාන වශයෙන් සමාජයට ඇති විය හැකි අතර තක්සේරුවලට අනුව ඔස්ට්‍රේලියාව වසරකට ඩොලර් බිලියන 21.6 ඒ වෙනුවෙන් වැය කරයි.

කුටුම්භ ප්‍රචණ්ඩත්වය තුළ ජීවත් වීම විශේෂයෙන් ම දරුවන්ට ඛේදජනක විය හැකිය. එහි බලපෑම් කම්පනය ඇති කරන්නා වූ, දිගින් දිගට ම පවතින දීර්ඝ කාලීන ඒවා විය හැකිය. එම අත්දැකීම් කාලයක් තිස්සේ වර්ධනය වී දරුවකුගේ ජීවිතයේ සෞඛ්‍ය, සංවර්ධන හා යහපැවැත්ම ඇතුළත්ව සියලු අංග කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

## 6. නිර්වචන

### යෙදුම්

**'කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය' යනු** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන සිදු කළ හැකි, කාන්තාවන්ට හානියක් හෝ වේදනාවක් ඇති කළ හැකි, ප්‍රසිද්ධියේ හෝ රහසිගතව සිදුවන ඕනෑම ක්‍රියාවකි. **'ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්ව'** යනුවෙන් අදහස් වනුයේ පුරුෂයන්ට (සමස්තයක් වශයෙන්) වඩා කාන්තාවන් කෙරෙහි විසමානුපාතික ලෙස බලපෑම් කරන ප්‍රචණ්ඩත්වයයි. එය බලය හා සම්පත් අසමානව බෙදී ගිය පුළුල් සමාජ සන්දර්භය තුළ සිදුවන බව හා එයින් උත්පාදනය වූ බල අසමතුලනය ප්‍රචණ්ඩත්වය ප්‍රතිස්ථාපනය කරන බවයි. කාන්තාවන් මුහුණපාන ප්‍රචණ්ඩත්වයෙන් වැඩි ප්‍රමාණයක් පවුල් සන්දර්භය තුළ (පුරුෂ සහකරුවන්, කලින් සිටි සහකරුවන්, හෝ පවුලේ වෙනත් සාමාජිකයන්) සිදු වුවත් එය හැම විට ම එසේ නොවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන කාන්තාවන් අත්විඳින ප්‍රචණ්ඩත්වය විවිධ ආකාර ගනියි. උදාහරණ වශයෙන් සහකරු නොවන/පවුලේ සාමාජිකයකු අතින් දූෂණයට ලක් වීම හෝ ලිංගික අතවරයට ලක් වීම, මුල් හමුවීම්වල ප්‍රචණ්ඩත්වය, ශාරීරිකව ප්‍රචණ්ඩත්වයට ලක් වීම හෝ එකට වැඩකරන අයෙකු, එකම පන්තියේ අයෙකු හෝ නාඳුනන්නෙකු විසින් සිදු කරන හිරිහැර

**'කුටුම්භ ප්‍රචණ්ඩත්වය'** යනු පුළුල් පවුල් ජාලය තුළ (උදාහරණ ලෙස පවුලේ සාමාජිකයන් අතර) සහ ප්‍රජා සාමාජිකයන් අතර ඇති වන, සමීප සම්බන්ධතා නම් සන්දර්භය තුළ සිදු වන විවිධ ප්‍රචණ්ඩත්වයන් (ශාරීරික, ලිංගික, මානසික, මූල්‍යමය)ය. ඇබොරිජිනල් හා ටෝරස් දූපත් ප්‍රජාවන්වල දී මෙන් ම වෙනත් සංස්කෘතික ප්‍රජාවන් හි දී ව්‍යාප්තිත ඥාතීන් හා පවුලේ සම්බන්ධතා අතර ඇතිවන ප්‍රචණ්ඩත්වය ද කුටුම්භ ප්‍රචණ්ඩත්වය සේ හැඳින්වේ. මෙම යෙදුම, සමීපතම සම්බන්ධයක සිටින හෝ සිටි පුද්ගලයන් දෙදෙනෙක් අතර ගෘහස්ත සැකසුමක දී සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා හඳුන්වන **'ගෘහස්ත ප්‍රචණ්ඩත්වය'** යන යෙදුමට වඩා බහුලව භාවිත වේ.

2008 වික්ටෝරියානු කුටුම්භ ප්‍රචණ්ඩත්ව ආරක්ෂණ පනත මගින්, "සිය සහකාරිය, කලින් සහකාරිය හෝ පවුලේ වෙනත් සාමාජිකයකු තුළ බිය හා පාලනය නිර්මාණය කරන්නා වූ ලෙස වන පවුලේ සාමාජිකයකුගේ චර්යාව" ලෙස කුටුම්භ ප්‍රචණ්ඩත්වය නිර්වචනය කරයි. මෙම චර්යාවන්ට විවිධාකාර විය හැකි අතර පහත ආකාරයන් ඇතුළත් විය හැකිය.

- ශාරීරික ප්‍රචණ්ඩත්වය එනම් පහර දීම, තල්ලු කිරීම, පිළිස්සීම හෝ හුස්ම හිර කිරීමට, රළු ලෙස සැළකීම, නොසැළකිල්ලෙන් රැකවරණ සැපයීම
- මානසික හා/හෝ වාචික හිංසනය (තර්ජනය කිරීම, දිගින් දිගට ම අවතක්සේරුවට ලක් කිරීම, නම් පටබැඳීම, ලිංගිකත්වය නිසා, ජාතිය නිසා, හැකියාව නිසා හෝ සමරිසි හිංසනය)
- භාවමය හිංසනය එනම් අපහාස, පාලනය කිරීම, තර්ජන
- මූල්‍යමය හිංසන එනම් මුදල්වලට ඇති ප්‍රවේශය පාලනය කිරීම
- ලුහු බැඳීම හෝ වෙනත් ආකාරයේ හිරිහැර
- ලිංගික ප්‍රචණ්ඩත්වය බල කිරීම ඇතුළත් ව
- පවුලේ සාමාජිකයන් හමුවන අය හා කරන කියන දේ සීමා කරමින් පවුලේ සාමාජිකයකු පාලනය කිරීමට, බිය ගැන්වීමට හෝ ඔවුන්ගේ ආත්මාභිමානය පලුදු කිරීමට යොදා ගැනෙන අනෙකුත් ආකාරවල චර්යාවන්

බහුවිධ වූ අසාධාරණයන් හා පීඩාවන් අත්විඳින කාන්තාවන් සම්බන්ධයෙන් සළකා බලන විට, අපරාධකරුවන් මෙම අවාසිය ඔවුන්ගේ හිංසනයේ අංගයක් ලෙස භාවිත කිරීම ඉඩ තිබේ. උදාහරණ ලෙස:

- යම් අයෙකුගේ දුබලතාවක් සඳහා භාවිත කෙරෙන උපකරණ හෝ ආධාරක ඉවත් කිරීම
- යමෙක් නිවෙසින් පිටතට දැමීමට තර්ජනය කිරීම
- කාන්තාවකගේ තාවකාලික වීසා තත්ත්වයක් ඇයව පාලනය කිරීමට උපයෝගී කර ගැනීම
- වියපත් පුද්ගලයකුට සිය මුදල්වලට ප්‍රවේශය හෝ ඒවායේ පාලනය අහිමි කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික නැඹුරුව, ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාව හෝ අනන්‍යතාව හඟවන ඕනෑම දර්ශකයක් වේවා මේ ඕනෑම අයෙකුට කුටුම්භ ප්‍රචණ්ඩත්වය අත්විඳීමට සිදු විය හැකිය. කෙසේ වෙතත් සංඛ්‍යානමය වශයෙන් අපරාධකරුවන්ගෙන් බහුතරයක් පුරුෂයන් වන අතර වින්දිත නොනැසී සිටින්නන්ගෙන් බහුතරයක් කාන්තාවන් හා දරුවන් වේ.

**'වියපත් හිංසනය'** යනු වියපත් පුද්ගලයක් හඳුනන ඔවුන් විශ්වාස කරන කෙනෙක් එනම් පවුලේ සාමාජිකයෙක් හෝ නෑ හිතමිතුරෙකු විසින් වියපත් පුද්ගලයාට හානි වන අන්දමින් සිදු කරන ඕනෑම ක්‍රියාවකි. හිංසනය මෙසේ සිදු විය හැකිය:

- ශාරීරික - පහර දීම හෝ තල්ලු කිරීම
- මූල්‍යමය - යමෙකුගේ දේපළ, මුදල් හෝ වෙනත් වත්කම් නීති විරෝධීව හා නුසුදුසු ලෙස භාවිත කිරීම
- භාවමය - වාචික හිංසනය සහ තර්ජන
- හෝ ලිංගික - අනවශ්‍ය ලිංගික ක්‍රියා හෝ අතපත ගෑම්

නොසළකා හැරීමත් මෙයට ඇතුළත් විය හැකි අතර, බොහෝ අවස්ථාවල දී කිසිප ආකාරයකින් හිංසනය සිදු වේ.

## 7. මාධ්‍ය හා පසුබිම් සම්බන්ධතා

කුටුම්භ ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට හා ඔවුන්ගේ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදකින විශේෂඥතාව ඇති පුද්ගලයින් හා ආයතන සොයා ගැනීමට මෙහිදී අප විසින් මාර්ග යෝජනා කර තිබේ.

ඉක්මණින් ම කල්පැන යන මාධ්‍ය හා පසුබිම් තොරතුරු ලැයිස්තුගත කිරීම වෙනුවට, නිරන්තරයෙන් යාවත්කාලීන වන මාධ්‍ය ඇමතුම් ලැයිස්තුවක්[6] සඳහා Our Watch වෙබ් අඩවියට පිවිසීමට අපි ඔබට ආරාධනා කරන්නෙමු.

### කුටුම්භ ප්‍රචණ්ඩත්වය ගැන විශේෂඥ ආයතන

- Our Watch
- ANROWS, Australia's National Research Centre for Women's Safety
- Djirra, කලින් Aboriginal Family Violence Prevention සහ Legal Service Victoria
- Domestic Violence Resource Centre (DVRC)
- Domestic Violence Victoria (DV Vic)
- InTouch Multicultural Centre Against Family Violence
- No to Violence, පුරුෂයන්ගේ කුටුම්භ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා වන ප්‍රධාන ආයතනය
- CASA Forum
- Women's Health East, නොනැසී සිටින්නන්ට උපදේශනය සඳහා ප්‍රවේශය
- 1800 RESPECT (Medibank – ජාතික සේවාව)

### පුද්ගලයන්

- Dr. Anatasia Powell, RMIT University
- Dr. Kate Fitz-Gibbon, Monash University
- Margaret Simons, journalist and writer

### විශේෂිත කණ්ඩායම්වලට වාර්තා කළ හැකි අදාළ සංවිධාන

- Gay and Lesbian Health Victoria
- Multicultural Centre for Women's Health
- Queerspace – ඩ්‍රමන්ඩ් ස්ට්‍රීට් සේවා
- Seniors Rights Victoria
- Thorne Harbour Health
- Women with Disabilities Victoria
- VicHealth
- Youth Affairs Council Victoria (YACVic)

[6] යාවත්කාලීන වූ මාධ්‍ය හා පසුබිම් සම්බන්ධතා ලැයිස්තුවක් සඳහා www.ourwatch.org.au/News-media/Media-Contacts වෙත යන්න.

## 8. මූලාශ්‍ර හා වැඩිදුර කියවීම්

### සංඛ්‍යා දත්ත හා සමීක්ෂණ


Australian Bureau of Statistics (ABS), 2017, *2016 පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ සමීක්ෂණය:* http://www.abs.gov.au/ausstats/abs@.nsf/mf/4906.0

Australian Bureau of Statistics (ABS), 2017, *වාර්තාගත අපරාධ - වින්දිතයන්, ඔස්ට්‍රේලියාව, 2017 - වික්ටෝරියාව:* http://www.abs.gov.au/ausstats/abs@.nsf/Lookup/by%20Subject/4510.0~2017~Main%20Features~Victoria~8

Australian Domestic and Family Violence Death Review Network, *දත්ත වාර්තාව, 2018:* http://www.ombudsman.wa.gov.au/Reviews/Documents/FDV/ADFVDRN_Data_Report_2018.pdf

Australian Institute of Health and Welfare, 2018, *ඔස්ට්‍රේලියාවේ කුටුම්භ, ගෘහස්ත හා ලිංගික ප්‍රචණ්ඩත්වය*: https://www.aihw.gov.au/reports/domestic-violence/family-domestic-sexual-violence-in-australia-2018/contents/summary

Crime Statistics Agency (Victoria), *කුටුම්භ ප්‍රචණ්ඩත්වය දත්ත කවුලුව*: https://www.crimestatistics.vic.gov.au/family-violence-data-portal

Morgan A & Chadwick H, 2009, *Key issues in domestic violence*. Research in practice No. 7. Canberra: Australian Institute of Criminology. https://aic.gov.au/publications/rip/rip07

VicHealth, 2013, *National Community Attitudes towards Violence Against Women Survey (NCAS)*: https://www.vichealth.vic.gov.au/media-and-resources/publications/2013-national-community-attitudes-towards-violence-against-women-survey (ANROWS *විසින් 2018 අගභාගයේ දී හෝ 2019 මුල භාගයේ දී නවතම (2017) සමීක්ෂණ ප්‍රතිඵල පළ කරනු ඇති බව සළකන්න.)*

වික්ටෝරියානු රජය, 2018, *Dhelk Dja: Safe Our Way. සවිමත් සංස්කෘතීන්, සවිමත් මිනිසුන්, සවිමත් ප්‍රජාවන්* https://www.vic.gov.au/system/user_files/Documents/fv/Dhelk%20Dja%20-%20Safe%20Our%20Way%20-%20Strong%20Culture%2C%20Strong%20Peoples%2C%20Strong%20Families%20Agreement.pdf

වික්ටෝරියානු රජය, කුටුම්භ ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් වන රාජකීය කොමිසම, නිර්දේශ 227 ක්‍රියාත්මක කිරීම පිළිබඳ තත්ත්වය, https://www.vic.gov.au/familyviolence/recommendations.html

World Health Organisation (WHO), *ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව දින 16ක ක්‍රියාකාරීත්වය*, පහත ලින්කුවෙන් ලබා ගන්න http://www.who.int/violence_injury_prevention/violence/global_campaign/16_days/en/index1.html


### මාධ්‍ය උපදේශන හා මූලාශ්‍ර


Australian Press Council, 2014, *සිය දිවි නසා ගැනීම ආවරණය සම්බන්ධයෙන් වන විශේෂිත සම්මතයන්* https://www.presscouncil.org.au/uploads/52321/ufiles/SPECIFIC_STANDARDS_SUICIDE_-_July_2014.pdf

Australian Press Council, 2016, *කුටුම්භ හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්වන උපදේශණාත්මක මගපෙන්වීම්,* https://www.presscouncil.org.au/uploads/52321/ufiles/Guidelines/Advisory_Guideline_on_Family_and_Domestic_Violence_Reporting.pdf

Kalinya & Department of Premier and Cabinet, 2017, *කුටුම්භ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඇබොරිජිනල්වරුන්ගේ අත්දැකීම්* වාර්තාකරණය http://kalinya.com.au/wp-content/uploads/2018/01/Reporting-on-Aboriginal-peoples-experiences-of-family-violence-media-toolkit-1.pdf

Monash University, 2018, *ඇතුළත් කර ගැනීමේ භාෂාව* https://www.monash.edu/about/editorialstyle/writing/inclusive-language

Media Diversity Australia, *Reporting on Aboriginal and Torres Strait Islander Peoples and Issues,* *https://www.mediadiversityaustralia.org/indigenous/*

Our Watch, *LGBTI ප්‍රජාවන් හි පුද්ගලයන් මුහුණපාන කුටුම්භ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම*, https://www.ourwatch.org.au/getmedia/13fdedoc-851b-4935-b402-e00fdb9b6e4b/Summary-report_Preventing-FV-against-people-in-LGBTI-communities-(Accessible-PDF).pdf.aspx

Pearson M & Polden M, 2014, The journalist's guide to media law: A handbook for communicators in a digital world, (මාධ්‍ය නීතිය පිළිබඳව මාධ්‍යවේදීන්ට වන මාර්ගෝපදේශන ඩිජිටල් ලොව තුළ සන්නිවේදනය සඳහා අත්පොතක්)Allen and Unwin

*Reporting on Aboriginal and Torres Strait Islander People and Issues: An introductory resource for the media (2018). (ඇබොරිජිනල් හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසීන්ගේ ගැටලු වාර්තාකරණය මාධ්‍ය වෙනුවෙන් වන මූලික මූලාශ්‍රයක්)*

*ක්වීන්ස්ලන්ත රජය, ගෘහස්ත හා කුටුම්භ හිංසනය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශනය:* https://www.communities.qld.gov.au/resources/gateway/campaigns/end-violence/domestic-family-violence-media-guide.pdf